# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,566—1965 නොවැම්බර් 24 වැනි බදාදා—1965.11.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 12 (1) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

අධ්‍යාපන අධ්‍යක්ෂ තැන්පත් අර්නස්ට් හර්බට් ද අල්විස් වන මම, 1962 වර්ෂයේ නොවැම්බර් මාසයේ 10 වෙනි දින අංක 13,389 දරන ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළවූ නියෝගයෙන් සංශෝධිත පරිදි, 1962 වර්ෂයේ මාර්තු 12 වැනි දින අංක 12,982 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද හලා/දූම්මලකොටුව රෝ. ක. මිශ්‍ර පාසලට අයත් සියලුම දේපල රජය වෙනුවෙන් භාර ගැනීමට වෙන්නප්පුවේ පාඨශාලා පරීක්ෂක තැන්පත් තම්මහෙට්ටි මුදලිගේ දෙන් විල්ෆ්‍රඩ් මාටින් පීරිස් මහතාට මෙයින් බලය පවරමි.

2. එකී තම්මහෙට්ටි මුදලිගේ දෙන් විල්ෆ්‍රඩ් මාටින් පීරිස් මහතා රජය වෙනුවෙන් පූර්වෝක්ත දේපල භාර ගැනීම වැළැක්වීමට හෝ බාධා කිරීමට හෝ විරෝධය දක්වීමට උත්සාහ කරන සෑම පුද්ගලයෙක්ම එකී පනත යටතේ වරදකරුවකු වෙනුවා පමණක් නොව, එකී පනතේ 27 වෙනි වගන්තිය යටතේ දඬුවමට භාජන කරනු ලැබිය හැකි ද වේ.

ඊ. එච්. ද අල්විස්,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

ජාපාඅඹ/252/යාපා.
අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
මැලේ විදිය, කොළඹ 2,
1965.11.21 වෙනි දින දී ය.

11–1132/1

---

### 1961 වර්ෂයේ අංක 8 දරන උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනත

#### 12 (2) වගන්තිය යටතේ කෙරෙන නිවේදනය

වෙන්නප්පුවේ පාඨශාලා පරීක්ෂක තැන්පත් තම්මහෙට්ටි මුදලිගේ දෙන් විල්ෆ්‍රඩ් මාටින් පීරිස් වන මම, 1962 වර්ෂයේ නොවැම්බර් මාසයේ 10 වැනි දින අංක 13,389 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ වූ නියෝගයෙන් සංශෝධිත පරිදි, 1962 වර්ෂයේ මාර්තු 12 වැනි දින අංක 12,982 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පල වූ 1961 වර්ෂයේ අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පැනවුනු පැවරුම් නියෝගයෙන් රජයට පවරා ගන්නා ලද හලා/දූම්මලකොටුව රෝ. ක. මිශ්‍ර පාසැලට අයත් දේපල 1965 වර්ෂයේ දෙසැම්බර් මාසයේ තුන් වැනි සිකුරාද පෙරවරු දහයට, එකී හලා/දූම්මලකොටුව රෝ. ක. මිශ්‍ර පාසලේ දී රජය සඳහාද, වෙනුවෙන් ද භාර ගැනීමට අදහස් කරන බව එම පාසැලේ දේපල ගැන අයිතිවාසිකම් ඇති සියළු දෙනා වෙතම මෙයින් දනුම් දෙමි.

(2) එම දේපලවලට අයිතිවාසිකමක් ඇති සියළුදෙනාම නැතහොත් ඔවුන්ගේ බලය ලත් නියෝජිතයින් මෙහි (1) ඡෙදයෙහි සඳහන් වූ දිනයන්හි නියමිත වෙලාවට එකී ස්ථානය වෙත පැමිණ, එම දේපල රජය සඳහා ද, වෙනුවෙන් ද භාර ගැනීමට මට ඉඩ දෙන ලෙසත්, සහාය වන ලෙසත් මෙයින් නියෝග කරමි.

ටී. ඩී. ඩබ්ලිව්. ඇම්. පීරිස්,
පාඨශාලා පරීක්ෂක.

1965 නොවැම්බර් මස 21 දින,
වෙන්නප්පුවේදී ය.

11–1132/2

---


ලංකාවේ වැලව්වේනගෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.

1633——ආර් 10470—6,775 (65/11)